www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජෙනරල් මෝටර්ස් බංකොලොත්වී වසරක් ගතවෙයි

## One year since the GM bankruptcy

**2010 ජූනි 04**

වසරකට ඉහතදී මෙම සතිය තුල එක්සත් ජනපද ඉතිහාසයේ විශාලතම කාර්මික කඩාවැටීම ප්‍රකාශයට පත් කරමින් දැවැන්ත මෝටර් රථ සමාගම වන ජෙනරල් මෝටර්ස් බංකොලොත්වීම නිවේදනය කලේය. රැකියා දස දහස් ගනනක් විනාශයට ඇද දැමීමට තත්වය සකසමින් ද දුසිම් ගනනක් උපාංග සහ අමතර කොටස් ශාඛා හා දහසකට වැඩි මෝටර් රථ අලෙවි ආයතන වසා දමමින් 2009 ජූනි 01 වෙනි දින ඔබාමා පාලන තන්ත්‍රය විසින් බංකොලොත් තීන්දුව සඳහා නියෝගය නිකුත් කලේය.

ගෝලීය වාහන නිෂ්පාදකයාගේ වස්තු භංගත්වය, කැනඩාවේ රැකියාවලින් දොට්ට දැමීම් ද බෙල්ජියමේ ඕපල් ශාඛාව වසා දැමීම මෙන්ම ජර්මනිය, ස්පාඤ්ඤය, බ්‍රිතාන්‍ය හා අනෙකුත් යුරෝපානු රටවල අවම වසයෙන් රැකියා 8,300ක් අහෝසි වීම ඇතුලු ජාත්‍යන්තර පරිමාන ප්‍රතිවිපාක ජනනය කලේය.

2012 වන විට, ජීඑම් ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුමට අනුව එහි වැටුප් බිල සියයට 30කින් කපා දැමීමේ පියවරක් ලෙස 96,000ක් වන එහි ශ්‍රම බලකායේ ස්ථිර හා අනියම් කම්කරුවන් 31,000ක් දොට්ට දැමීමට නියමිතය. මෙය දැනටමත් වාර්තාගත කම්කරුවන් සංඛ්‍යාවකට නිවාස අහිමිවීමෙන් ද පලාත් ආන්ඩු හා පාසැල් අරමුදල් හිඟයෙන් ද පෙලෙන ආර්ථික වසයෙන් විනාශයට මුහුනපා සිටින ඔහියෝ, මිචිගන් හා අනෙකුත් ප්‍රාන්ත වල, ජනප්‍රජාව හා නගර මත බියකරු මානව බරක් බවට පත්වෙමින් තිබේ.

2009 ජුලි 10 වෙනි දින බංකොකොලොත් වීම් ප්‍රකාශයට පත්කරන අධිකරනයෙන් "නව ජීඑම්" ලෙස ඉවතට පැමිනි සමාගම රැකියා අහෝසි කිරීමට අමතරව වැටුප් හා දීමනා ද නිර්දය ලෙස කපා හැර ඇත. එක්සත් ජනපද භාන්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පනවන ලදුව එක්සත් වාහන කම්කරු සමිතිය විසින් ක්‍රියාවට දමා ඇති නියමයන් යටතේ වත්මන් කම්කරුවන් සඳහා වැටුප් කැටිකර තිබේ. ජීවන වියදම් දීමනා අත්හිටුවීම, විවේක කාලය හා නිවාඩු දින සැලකිය යුතු මට්ටමකින් අඩු කර තිබේ. දන්ත සෞඛ්‍ය හා දෘෂ්ටි ආරක්ෂාව ඇතුලුව සෞඛ්‍ය දීමනාවන් විශ්‍රාමිකයන්ට අහිමි කර තිබේ.

වාහන කම්කරුවන්ගේ ඊලඟ පරම්පරාවට වඩාත් දරුනු ලෙස වන්දිගෙවීමට සිදුවනු ඇත. පැයකට ඩොලර් 14ක් වන අලුත් කම්කරුවෙකුගේ ආරම්භක වේතනය බදු සහ වෘත්තීය සමිතිවල ගාස්තු ගෙවීමට පෙර වාර්ෂික දල ආදායම ඩොලර් 28,000ක ට පරිවර්තනය කෙරේ. මෙය එක්සත් ජනපද මධ්‍යම කුටුම්භයක වාර්ෂික ආදායම් සීමාවෙන් අඩකටත් වඩා අඩුවන අතර ආන්ඩුව බෙහෙවින් අඩු තක්සේරු කල සිව් දෙනෙකුගෙන් යුත් පවුලක අවම දරිද්‍රතා මට්ටමට වඩා මඳක් වැඩිය. ශතවර්ෂයක් තුල ප්‍රථම වතාවට වාහන කම්කරුවෙකුට තමන්ම නිෂ්පාදනය කල වාහනයක් සතු කර ගැනීමට නොහැකි වනු ඇත.

සිටි ආයෝජන පර්යේෂන මන්ඩලයේ විශ්ලේෂක ඉටෙ මිචෙලි පසුගිය සතියේ පාරම්බෑවේ වාහනයක් සඳහා ජීඑම්හි ස්ථාවර වියදම පසුගිය වසරේ ඩොලර් 10,400 සිට මෙම වසරේදී ඩොලර් 7,280 දක්වා පහත වැටෙනු ඇති බවත් 2012දී ඩොලර් 5,772ට බසිනු ඇති බවත් ය. ඊලඟ වසර පහේදී - 2009, අප්‍රේල් 30 දින බංකොලොත් බවට නම් කල - ජීඑම් සහ ක්‍රයිස්ලර්හි ශ්‍රම වියදම එක්සත් ජනපදය තුල වෘත්තීය සමිති වලින් තොරව ක්‍රියාත්මක වන මොනයම්ම හෝ ජපාන වාහන සමාගමකට වඩා අඩු වියහැකි අතර එනයින් කුඩා මෝටර් රථ මෙක්සිකෝවේ නිපදවනවාට වඩා එක්සත් ජනපදයේ නිපදවීම වඩා ලාභදායක විය හැකිය.

මෙහි ප්‍රතිපලයක් වසයෙන් මෝටර් රථ සමාගම මෑතකදී නිවේදනය කලේ පසුගිය වසරේ මෙම කාලයේම ඩොලර් බිලියන 6ක් පාඩු ලැබීමට ප්‍රතිපක්ෂව එහි ශුද්ධ ආදායම ඩොලර් මිලියන 865 දක්වා වැඩිවුන බවයි. තව ද, කම්කරුවන්ගේ රැකියා හා ජීවන තත්වයන් නැතිභංග වී යන අතරේ, එක්සත් ජනපද ආන්ඩුව විසින් ඉදිරියේදී තමන් සතු ජීඑම් කොටස් විකුනන විට, ලාභ ගරාගැනීමට වෝල්වීදිය බලාපොරොත්තු වෙයි.

*වෝල් ස්ට්‍රීට් ජර්නලයට* අනුව, "2008 වසරේ වෙලඳපොල බිඳ වැටීමේ පටන් වෝල් වීදියේ බැංකු

කරුවන් ඔවුන්ගේ ලොකුම පඩි දිනයන්ගෙන් එකක් වන සැලසුම්කර ඇති ජෙනරල් මෝටර්ස් කොටස් අලෙවිය සිදුවන දින තෙක් කෙල හලමින් සිටී." එක් කොටසක් ඩොලර් 113 සිට 137 දක්වා අලෙවි වනු ඇති ජීඑම් ව්‍යාපාර කොටස් අලෙවියේ ශුද්ධ වටිනාකම ඩොලර් බිලියන 70ක් පමන වියහැකි යයි ඇතැම් විශ්ලේෂකයන්ගේ පෙරදැකීම් සමග විශාල මූල්‍යමය සමාගම් ගාස්තු වසයෙන් ඩොලර් බිලියන 2ක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙති. මෙය ඉතිහාසයේ තනි ව්‍යාපාර ගනුදෙනුවකදී ලබන විශාලතම ලාභය වනු ඇත.

ජේපී මෝගන් චේස්, මෝගන් ස්ටැන්ලි, බැන්ක් ඔෆ් ඇමෙරිකා, සිටිගෲප් හා ගෝල්ඩ්මන්ඩ් සැක්ස්හි සුපිරි බැංකුකරුවන් ගනුදෙනුවේ ප්‍රධාන සහතික කරුවන් ලෙස තමන් තෝරා ගන්නා ලෙස ඔබාමා පාලන තන්ත්‍රය ඒත්තු ගැන්වීම සඳහා භාන්ඩාගාර නිලධාරීන් හා ජීඑම් ප්‍රධානීන් සමඟ රැස්වීම් මාලාවක් පවත්වා තිබේ.

ජීඑම් සහ ක්‍රයිස්ලර් බංකොලොත්තුව නිරීක්ෂනය කල ධවල මන්දිරයේ "මොටර් රථ සාර්වරුන්" වන්නේ, ජීඑම් හි ඩොලර් බිලියන 40ක කොටස් අලෙවිය පිලිබඳව ආන්ඩුවට උපදෙස් දීමේ කටයුත්ත පවරන ලද වෝල් වීදියේ තවත් සමාගමක් වන ලසාර්ඩ්හි හිටපු විධායකයින් දෙදෙනෙකි. ශුද්ධ ආදායම ඩොලර් මිලියන 600කට වඩා ඉහල යැයි වාර්තාගත පෞද්ගලික ව්‍යාපාර වස්තු ආයෝජකයෙක් වන ස්ටීවන් රැට්නර්, නිව් යෝර්ක් ප්‍රාන්තයේ විශ්‍රාමික අරමුදලෙන් ලාභදායි ආයෝජන ලබාගැනීම පිනිස නීති විරෝධී සන්තෝසම් පිරිනැමීමේ වැඩසටහනකට ඔහුගේ සම්බන්ධය නිසාවෙන් ආරක්ෂන හා විනිමය කොමිෂම සමඟ ප්‍රශ්නවලට පැටලී සිටී.

මහා ව්‍යාපාරිකයන්ට අමතරව, එක්සත් මෝටර් රථ කම්කරු සමිති තන්ත්‍රය ද ජීඑම් කොටස් වෙලඳාමෙන් බිලියන ගනනක් ලබා ගැනීමට ඉදිරියට පැමින සිටී. තමන් නියෝජනය කරන්නේයැයි කියන කම්කරුවන්ගේ ජීවන කොන්දේසි, වැඩ කොන්දේසි හා රැකියා විනාශ කිරීමට දායකත්වය සැපයීමට හුවමාරු වශයෙන් ඩොලර් ප්‍රකෝටි ගනනක විශ්‍රාමික සුව ආරක්ෂන භාරකාර අරමුදලේ පාලනය, සමාගම් අධ්‍යක්ෂ මන්ඩලයේ තනතුරු, ජීඑම් හි කොටස් වලින් සියයට 17.5ක හිමිකාරිත්වයක් හා ක්‍රයිස්ලර්හි බහුතර කොටස් හිමිකාරිත්වය යූඒඩබ්ලිව් සමිතිය වෙත පවරා දුනි.

පසුගිය මාසයේ ඇමෙරිකානු පුවත්පත් මන්ඩලය ඉදිරියේ කතා කරමින් ඉවත්ව යන යූඒඩබ්ලිව් ප්‍රධානී රොම් ගෙට්ල්ෆින්ගර්, ජීඑම්හි වාර්තාගත ලාභ සහ පසුගිය දශකයක් පුරා යලි යලිත් සමිතිය කල සහන පිරිනැමීම් ආරක්ෂා කලේය. දශකයක් තුල ක්‍රයිස්ලර් සමාගම පලමු වතාවට බඳවාගත් නව සේවක පිරිස සේවයේ යෙදවීමත්, ජීඑම් සමාගම් දැන් ලාභ ලබමින් "ඉදිරියට යන" බවත් ඔහු පැවසීය.

අභිනවයෙන් සේවයේ යෙදවූවන්ට ලැබෙනුයේ ඔවුන්ට මෝටර් රථයක් මිලදී ගැනීමටවත් ප්‍රමානවත් නොවන වැටුපක්ය යන කාරනය මතුකල විට ගෙටල්ෆින්ගර් වැටුප් කප්පාදුව ආරක්ෂා කරමින් කථාකලේය. "අප කලේ අපට හෙට දිනය උදාකර ගැනීම සඳහා කල යුතුව තිබුනු දෙයයි. "නිවැරැදි ප්‍රවේශය" වූයේ එය බව කියමින් ඔහු, බංකොලොත්වීම් සලකා බලන උසාවි යොදාගැනීමේ ඔබාමාගේ තීන්දුව වර්නනා කලේය. "මම හිතන්නේ ඔහු කල දේ කිරීමට පියවරක් ඉදිරියට ගැනීමේදී ජනාධිපතිට ධෛර්ය බෙහෙවින් අවශ්‍ය වුනා, ඒත් ඔහුට ලැබුනු කෙටි කාලය සලකන කල එය විශිෂ්ට තීන්දුවක් වී යයි මම සිතමි," ඔහු කීවේය.

2009, ජූනි පලවෙනි දින *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මෙසේ සටහන් කලේය: "ක්‍රයිස්ලර් සහ දැන් ජීඑම් බංකොලොත්භාවයට තල්ලු කිරීමෙන් එක්සත් ජනපදයේ පන්ති සබඳතාවල මූලික ප්‍රතිසංවිධානයක් කිරීම පිනිස ආර්ථික අර්බුදය ගසා කෑමට ඔබාමා පාලානාධිකාරය මං සොයමින් සිටී. ප්‍රධාන කර්මාන්ත තවදුරටත් පිරිහෙලීමට සහ ඇමෙරිකානු ආර්ථිකයේ සෑම අංශයකම කම්කරුවන්ගේ ජීවන තත්වයන් අනවරතව පිරිහෙලීම සහ අතුගා දැමීම මෙයට අන්තර්ගතය."

මෙම අනතුරු ඇඟවීම සනාථ වී තිබේ. ජීඑම් සහ ක්‍රයිස්ලර් කම්කරුවන් මත පැටවූ ම්ලේච්ඡ කොන්දේසි සමස්ත කර්මාන්තයේ ද රාජ්‍ය සේවයේ ද වැටුප් හා දීමනා පහත හෙලීමටත් වැඩ වේගවත් කිරීමටත් පෙරනූවිරූ මෙහෙයුමක් සඳහා මුරගල වසයෙන් ප්‍රයෝජනයට ගන්නා ලදී. සුව සුරැකුම් හා සමාජ ආරක්ෂනය වැනි "අත්හල නොහැකි" අයිතීන් අහෝසි කිරීම සහ පොදු අධ්‍යාපනය හා අනෙකුත් අත්‍යාවශ්‍ය සේවාවන් කැපීම සඳහා වැඩෙන ඉල්ලීම් සමඟ එය සම්පාත වී තිබේ.

වෝල් ස්ට්‍රීට් ජර්නලයේ තීරු රචක පෝල් ඉන්ග්‍රාසියා "ජීඑම් බංකොලොත්තුවේ පාඩම්" යන හිසින් යුතුව මේ සතියේ ලියන ලද කතු වැකියකින් මෙය පැහදිලි කෙරින. ඔහු මෙසේ ලීවේය: "කෙලවරක් නැතිව කම්කරුවන් වැඩෙහි නොයෙදී සිටින විට (එක්සත් රථවාහන කම්කරු සමිතියේ රැකියා බැංකුවෙහි) කම්කරුවන්ට ගෙවීම හා මසුරන් වටින විශ්‍රාම වැටුපක් හා සුව-ආරක්ෂන දීමනා ලබාදීම හාස්‍යජනක හා දැරිය නොහැක්කක් බව සියලු දෙනාම දැන සිටියහ."

"දැන්, අප දැරිය නොහැකි අයවැය හිඟයක් මැදින් ගමන් කරන බව සියලු දෙනාම දනිති. බොහෝ ප්‍රාන්තවල රාජ්‍ය සේවකයන්ට සපයන වරප්‍රසාද නිසා සේවක විශ්‍රාමික අරමුදල්වල ප්‍රමානවත් තරම් මුදල් නැත. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරන හා ගිනුම්වල විනිවිදභාවයකින් තොරව රජයේ විද්‍යාලවලට තව තවත් මුදල් යෙදවීම ප්‍රතිඵල නොඋපදවන අතර අනාගතයේ ද එසේ සිදු නොවනු ඇත," ඔහු තවදුරටත් කීවේය.

"මෙම පියවරයන් ක්‍රියාත්මක කිරීමෙන් නියත ලෙසම අදහස් කරන්නේ වියදම් කිරීමේ විනයක් බල ගැන්වීමත් ජීඑම් යූඒඩබ්ලිව් සමිතිය සමග ක්‍රියා කල ආකාරයට ම රාජ්‍ය-සේවක වෘත්තීය සමිති සමඟ ද කටයුතු කිරීම ය. මෙය එක දිගටම හෙලා දැකීමත් ප්‍රතික්ෂේප කිරීමත් ව්‍යසනකාරී වනු ඇත. වෙනත් ලෙසකින් කිවහොත්, ඇමෙරිකාව ජෙනරල් මෝටර්ස් ඇප දී බේරාගත්තේ ය, එහෙත් ඇමෙරිකාවට ඇප බඳින්නේ කවුද ?"

ව්‍යාපාරික, දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයේ නිල කවයන් තුල සියලු දෙනාම කම්කරුවන් අන්ත දරිද්‍රතාවට ඇද දැමිය යුතු බව දැන සිටියි. එහෙත් මිලියන ගනනක් රැකියා විනාශ කිරීම හරහා ග්‍රීසිය, ස්පාඤ්ඤය වැනි රටවල නගර, ප්‍රාන්ත, බංකොලොත්භාවයට ඇද දැමීමෙන් ද මූලික කර්මාන්ත විනාශ මුඛයට යැවීමෙන් ද ධනවත් වූ මූල්‍ය ප්‍රභූවේ අමන සමපේක්ෂනය සඳහා කම්කරු පන්තිය වග නොකියන අතර ඒ සඳහා වන්දි ගෙවිය යුතු ද නැත.

මෙම ව්‍යාපාරික හා මූල්‍ය කතිපයාධිකාරීන්ගේ සුඛෝපභෝගී දිවි පෙවත සහ පරපෝෂිත කටයුතු වලට අරමුදල් යෙදවීම සමාජයට තවදුරටත් දැරිය හැකි නොවේ. ඒ වෙනුවට සුපිරි ධනවතුන්ගේ අයිතියෙන් සමාජයේ මූලික කාර්මික හා මූල්‍ය සම්පත් තමන් අතට ගැනීමට සහ එය කම්කරු පන්තියේ සාමූහික හා ප්‍රජාතාන්ත්‍රික පාලනයේ තැබීමටත් මහ ධනපතියන්ගේ පක්ෂ දෙකට එරෙහි හා ඒවායින් ස්වාධීන කම්කරු පන්තියේ දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතුය.

එවැනි අරගලයක් සඳහා පූර්ව කොන්දේසිය වන්නේ යූඒඩබ්ලිව් හා එහි පන්ති සහයෝගිතාවේ ප්‍රතිගාමී ක්‍රියාමාර්ගයෙන්, ආර්ථික ජාතිකවාදයෙන් හා ඩිමොක්‍රටික් පක්ෂයෙන් බිඳී වෙන්වීම සහ කම්කරු පන්ති අරගලයේ නව සංවිධාන ගොඩ නැගීමත්ය.

ජෙරී වයිට්

© www.wsws.org